# ශ්‍රී ලංකාවේ සමනලයෝ

## ආචාර්ය තෙල්මා පී. පී. ගුණවර්ධන
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා

සමනලුන් සූර්ය රශ්මියට ඇළුම් කරන අතර සූර්ය රශ්මිය නොඅඩුව ලැබෙන ශ්‍රී ලංකාව සමනල විශේෂ දෙසිය හතලිහකට නොඅඩු සංඛ්‍යාවකට නිජබිම වීම අරුමයක් නොවේ.

පාට පාට මල්, ගස්වැල් සහ සූර්යෝදය මෙන්ම අප අවට දර්ශණය අලංකාර කරන දෙයකි සමනලුන්. උන්ගේ දැකුම්කළු වර්ණ රටාවන්, පුදුම එලවන වේශාන්තරණයන්, රිත්මයානුකූල ඉගිලීම, විවිධාකාර අනුකරණයන් සහ සංක්‍රමණික සිරිත් ද ඇත්තෙන් ම කුතුහලය දනවන, සිත්ගන්නා සුළු අධ්‍යයනයකි.

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සමනල විශේෂ එකසිය පණහක් පමණ කෙනෙකුට ගැණිය හැකි ය. එතෙකුදු වුව ද සමනලයින් අධ්‍යයනයට ඉතාමත් උචිත ප්‍රදේශය වන්නේ ළඳක හැඳි වතක් මෙන් වන ලැහැබින් වැසුණු කඳු ගැට පෙලින් හෙබි පහත් කඳුකරයයි. මෙම ප්‍රදේශය සිසාරා සමනල විශේෂ දෙසියකට අධික සංඛ්‍යාවක් අපට දැකිය හැකි වෙයි.

ශ්‍රී ලංකාවේ අතිශයින්ම දැකුම්කළු සමනල විශේෂය අයත් වන්නේ පැපිලියෝනිඩ් නමැති වංශයටයි. එමතු ද නොව, "ට්‍රෙයිඩස් ඩාර්සියස්" හෙවත් "සාමාන්‍ය කුරුළු තටු සමනලයෝ" නමැති ලංකාවේ වෙසෙන විශාල තම සමනල විශේෂය අයත්වීමේ ආඩම්බරය ද මෙම වංශයට හිමිවේ. ශ්‍රී ලංකාවේ වියලි කලාපීය වනපෙත් වල වෙසෙන පැපිලියෝ ක්‍රීනෝ හෙවත් "ඉරි වැටුණු මොණරා" නමැති සමනලයා ලංකාවේ වෙසෙන ඉතාමත් ම ලක්ෂණ සමනලයා ලෙස පහසුවෙන් ම නම් කළ හැකි ය. තත් වංශයට ම අයත් බ්ලූ මොර්මොන් හෙවත් (පැපිලියෝ පොලිමා නෙස්ටර් පැරින්ඩා) නමැති සමනලයා ද ඉතා දැකුම්කළු වනු පමණක් නොව ශ්‍රී ලංකාව නිජබිම කොටගත් දෙවන විශාලතම සමනලයා ද වේ.


පැපිලියෝනීඩා වංශයට අයත් තවත් කුතුහලය දනවන සමනල විශේෂයක් වන්නේ කොමන් මොර්මොන් හෙවත් පැපිලියෝ පොලිටෙස් රෙමියුලස් ය. මෙම විශේෂයේ ගැහැණු සතා ත්‍රිවිධාකාරය. මින් දෙආකාරයක සතුන්, එනම් රොමියුලස් නමැති ගැහැණු සතා සහ ස්ටිකියස් නමැති ගැහැණු සතා ද පිළිවෙලින් ක්‍රිම්සන් රෝස් (පැකිලොප්ටා හෙක්ටර්) සහ කොමන්රෝස් හෙවත් (පැපිලොප්ටා ඇරිස්ටෝලෝකියා) නමැති එම වංශයේ ම වෙනත් සතුන් දෙදෙනෙකු අනුකරණය කරති. තුන්වැන්නා සයිරස් නමැති පිරිමි වේශය ගනී. මෙම වේශාන්තරණයෙන් උනට ඇතිවන වාසිය වන්නේ, ඔවුන් අනුකරණය කරන පැකිලොප්ටා නමැති විශේෂය විෂ සහිත වන බැවින් ඔවුන් ද එම විශේෂය මෙන් විෂ සහිත යයි සිතා කුරුල්ලන් සහ උරගයන් වැනි ගොදුරු සොයා යන සතුන් නොකා හැරීම ය. වෙනත් වංශවල ද "ආහාරයට නුසුදුසු" වර්ග මෙලෙස අනුකරණය කිරීම් දැකිය හැකිය.

වර්ණ රටා ද්වයක් ඇති පැපිලියෝනිඩා වංශයටම අයත් තවත් සමනල විශේෂයක් නම් ශ්‍රී ලංකාවට ආවේණික සාමාන්‍ය අනුකරණික කුඩා අර්ධ විශේෂයයි. කොමන් මොර්මොන් මෙන් නොව කුඩා අනුකරණිකයා (කයිලාසා ක්ලයිටිස් ලංකේශ්වර) ලිංග දෙකේ ම වර්ණ ස්වරූප සහිතය. මින් දුඹුරු වර්ණ ස්වරූපී සමනලයා යුප්ලොයියා (ක්‍රෝ) නමැති වර්ගයේ ඩැනයිඩ්ඩන් විශේෂ හතරක් අනුකරණය කරන අතර, ශෛවෙත වර්ණ ස්වරූපී සමනලයා ඩැනේයස් ට්‍රිමියුටාලා (ටයිපාර්ස්) නමැති වර්ගයේ ඩැනයිඩ් විශේෂ වැඩි කොටසක් ම ආහාරයට නුසුදුසු (විෂ සහිත) වන බැවින් උන් අනුකරණයෙහි යෙදෙන කොමන් මයිම් විශේෂයේ සමනලුන් ද ඒ නිසා ගොදුරු සොයා යන සතුන්ගෙන් ගැළවෙති.

සමනලුන්ගේ වර්ණ විපර්යාසයන් ද කුතුහලය දවන අධ්‍යයනයකි. එහෙත් අවාසනාවකට මෙන් මෙම විෂයය පිළිබඳව ශ්‍රී ලංකාවේ මෙතෙක් කර ඇති අධ්‍යයනයන් ඉතා අල්ප ය.

මෙකී වර්ණ විපර්යාසයනට අමතර විපර්යාසිත ස්වරූපධර සමනලයන් ද නිතරම පාහේ වනගතව දැකිය හැකි ය. මෙවැන්නන් සහජ පරම්පරානුකූල රටාවක් අනුව ඇති නොවන බැවින් එකම වර්ණ රටාවක් රැගත් සමනලුන් දෙදෙනෙකු මෙලෙස බිහි නොවේ. ඒ හේතුවෙන් මෙවන් සමනලයකු, සමනලයින් එකතු කරන්නකු හට මහඟු වස්තුවක් වේ.

අපගේ සමහර සමනලුන් වේශාන්තරණය පිළිබඳව කදිම නිදසුන් වෙති. කවුරුත් හොඳින් දන්නා මෙවැනි වේශාන්තරණයන් ඇත්තේ නිම්ෆැලිඩා වංශයට අයත් විශේෂ කිහිපයකට. ශ්‍රී ලංකාවේ මෙම වංශික විශේෂයන් 40 ක් පමණ ඇති අතර, ඔවුන් ද පැපිලියෝනිඩා වංශිකයන් මෙන්ම අතිශයින් දැකුම්කළු ය.



මොවුනතරින් පුස්කොල සමනලයාගේ (කැලීමා පිලාකස්) පියාපත්වල උඩපැත්ත සුදු සහ දුඹුරු පැහැති රතුපාට මිශ්‍රිත නීල වර්ණයෙන් අලංකාර වී ඇත. එහෙත් එම පියාපත්වල යටිපැතිවල වර්ණ රටාවන් කෙතරම් විවිධාකාරවේ ද යත් එකාකාරව වර්ණ රටාවන් පිහිටි සමනලුන් දෙදෙනෙකු කිසිසේත් සොයාගත නොහැකි ය. එම පියාපත්වල යටිපැත්ත වියලි කොළයක විවිධ අවස්ථාවන් නිරූපනය කරන අතර, පියාසර නොකරන විට උං හඳුනා ගැනීම ඉතාමත් දුෂ්කර වන බැවින් ගොදුරු සොයන සතුන්ගෙන් උං හොඳින් ආරක්ෂා වේ.

වියලි කොළයක් අනුකරණය කරන තවත් නිම්ෆැලිඩයකු නම් පෘථුල ව්‍යාප්තියක් ඇති "බ්ලූ ඇඩ්මිරල් " (කණිෂ්කා කැනසේ) නමැති සමනලයාය. "ඕක්කොළ" සමනලයා මෙන් නොව "බ්ලූ ඇඩ්මිරල් " සමනලයාගේ පියාපත්වල තීරයන් කඩතොළු සහිත වන බැවින්, වියලී යන කොළයක ස්වරූපය ගනී.

මෙම වංශයේ ඉතා කුතුහලයක් දනවන විශේෂයන් වන්නේ කොමන් ලැස්කාර් (පැන්ටොපේරියා හර්ඩෝනියා) නමැති සමනලයා ය.

අන් කිසිම සමනලයකු නොකරන අන්දමින් උඟු කුරකු (නියුරොකේම්ස් වුලියා) අනුකරණය කරයි. වර්ණ රටාව පමණක්ම නොව උගේ පියාසර කිරීමේ විලාශය ද යටකී කුරාගේ මෙන් ම ය.

මේ අනුව අපට පෙනී යන්නේ තම දිවි බේරාගෙන ජීවත්වීම සඳහා සමනලුන් විවිධ අන්දමේ අනුකරණයන්හි යෙදෙන බව ය.

නිම්පලිඩයන් අතුරෙන් හයිපොලිමස් මිසිපස් මිසිපස් (ඩැනයිඩ් එග් ප්ලයි) ගැහැණු සතා ඩැනිඩේ වංශයේ ඩේනස් විශේෂයේ (ප්ලේන් ටයිගර්) වර්ණ ස්වරූප තුනක් අනුකරණය කරයි. විවිධ වේශාන්තරණයේ යෙදෙන මෙම චිත්තාකර්ශණීය සමනල විශේෂය පිළිබඳව ද මෙතෙක් ප්‍රමාණවත් අධ්‍යයනයක් කර නොමැත.

ආහාරයට යෝග්‍ය විශේෂයන් ආහාරයට අයෝග්‍ය විශේෂයන් අනුකරණය කිරීම අපට පහසුවෙන් තේරුම් ගත හැක. එහෙත් ආහාරයට අයෝග්‍ය විශේෂයන් ආහාරයට අයෝග්‍ය තවත් විශේෂයන් අනුකරණය කරන විට ඊට හේතුව තේරුම් ගැනීම එතරම් පහසු කරුණක් නොවේ.

"අන්තරාව ඇඟවීමේ සංඥාවන්, අද්භූත වර්ණරටාවන් සහ විකෘති ස්වභාවයන් අනුකරණීය වර්ණ රටාවන් මගින් දක්වන අවස්ථාවන් කිහිපයක් මේ දක්වා මවිසින් පෙන්වා දී ඇත. එහෙත් මීට අමතර වශයෙන් වෙනත් විපර්යාසිත ස්වරූපයන් ද දක්නට හැකි ය.

"වයිට්ස්" හෝ "සල්පර්ස්" නමැති සාමාන්‍ය නමින් හැඳින්වෙන පියරිඩා වංශයේ සාමාජිකයින් දේශගුණික තත්ත්වයන් අනුව වෙනස් වන ඍතුක ස්වරූපයන් ගනිති. ශ්‍රී ලංකාවේ මෙම වර්ගයන් "වියලි" හා "තෙත්" කාල ස්වරූපයන් ගනිති. මෙය ගැහැණු පිරිමි දෙවර්ගයටම එකසේ බලපායි.

මෙම විපර්යාසයනට අමතරව තවත් ඉතා කුතුහලය දනවන එක් විපර්යාසයක් වන්නේ පියාපත්වල එක පැත්තක පිරිමි වර්ණ රටාවන් හා අනෙක් පැත්තේ ගැහැණු වර්ණ රටාවන් පිහිටීම ය. එනෙකුදු වුව ද මෙම සමනලුන්ගේ ශරීරය එක් ලිංගයකට පමණක් සීමා වේ. "ගයිනෙන්ඩ්‍රොමෝෆස්" නමැති මෙම මෙනකරූපාකරණය ශ්‍රී ලාංකික විශේෂයන් අතර එතරම් දුලභ නොවේ. ඉන්ඩියන් ෆ්‍රිටිලරි (ආගිනිස් හයිපර්බියස් ටැප්‍රොබානා) නමැති මෙනකරූපාකරණය වෙනත් සමනල විශේෂයන් අතර ද දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ සමනල වංශ නවයෙන්, ලයිසනිඩේ නමැති වංශයට විශේෂ අසූ එකක් අයත්වන අතර මෙය ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සමනල විශේෂයන් ප්‍රමාණයෙන් හරියට ම තුනෙන් එකක් වේ. මෙම සමනලයන් සාමාන්‍ය වශයෙන් "බ්ලූස්" නමින් හැඳින් වෙන ඉතා කුඩා සමනලුන් වෙති.

මෙම සමනල විශේෂ සමහරක ජීවන ඉතිහාසයන් අතිශයින් ම චමත්කාර ජනක ය. ඉන් සමහරක පිලවුන් ආරක්ෂා කරනු ලබන්නේ කුහුඹුවන් විසිනි. එබැවින් කුහුඹුවන් ගෙන් වෙන් වූ රසායනාගාර පරිසරයක ඔවුන් ඇති කිරීම එතරම් සුකර නොවේ. ඉතාමත් විරළ වූ ශ්‍රී ලාංකික සමනලයින් අයත් වන්නේ ද මෙම වංශයට ය. මින් එකක් වන්නේ ඕම්ස්ටන්ගේ ඕක් බ්ලූ (ආහෝපාලා ඕම්ස්ටෝනි) නමැති සමනලයා ය. මේ දක්වා මෙම සමනලයින් එකතුකර ඇත්තේ දකුණු පළාතේ නාකියාදෙනියේ සහ ගාල්ලෙන් අල්ලා ගන්නා ලද පිරිමි සතුන් හත් දෙනෙකු හා එක ගැහැණු සතකු ද පමණි.

සමනලුන් පිළිබඳව අපගේ කුතුහලය දනවන තවත් අංගයක් වන්නේ උන්ගේ සංක්‍රමණික ගති පැවැතුම් ය. මෙම දුබල කෘමීන් සාමූහික වශයෙන් සංක්‍රමණය වීම ශ්‍රී ලාංකික අප කවුරුත් පාහේ හොඳින් දැක ඇති දෙයකි. ශ්‍රී ලංකාවේ වෙසෙන සමනල විශේෂ දෙසිය හතලිහෙන්, විශේෂ හැට නමයක් ම මෙලෙස සංක්‍රමණයේ යෙදෙන බැව්. සොයාගෙන ඇත.

මෙම සංක්‍රමණිකයන්ගෙන් බහුතර සංඛ්‍යා වක් ම අයත් වන්නේ නිම්ෆලිඩා, පයිරිඩා, ලයිසනිඩා, සහ පැපිලියෝනිඩා නමැති වංශවලට ය.


සමනල සංක්‍රමණය පිළිබඳව ශ්‍රී ලංකාවේ පර්යේෂණ පවත්වා ඇති ප්‍රමාණය ඉතා අල්ප වුවද, ප්‍රධාන සංක්‍රමණික කාලසීමාවන් දෙකක් තිබෙන බව නිගමයන කිරීමට තරම් ප්‍රමාණවත් සාධක අපට ලැබී ඇත. මින් ප්‍රධාන කාලසීමාව මාර්තු මස පටන් මැයි මස දක්වා ද දෙවන කාල සීමාව නොවැම්බර් මස පටන් දෙසැම්බර් මස දක්වා ද විහිදේ.

මෙලෙස සංක්‍රමණය වීමට තුඩුදෙන හේතූන් මෙතෙක් සොයාගෙන නැත. තමන්ගේ සාමාන්‍ය වාසභූමිවල ආහාර හිඟය මෙන්ම සංක්‍රමණය වීමේ දී වඩා හොඳින් මිශ්‍රවීමට ඇති අවස්ථාවන් ද මීට සහේතුක විය හැකි ය.

ඉන්දීය ප්‍රධාන භූමිතලයෙන් සමනලයින් මෙහි සංක්‍රමණය වෙතැයි සිතීමට තරම් සාධක මෙතෙක් සොයාගෙන නොමැත. එනෙකුදු වුව ද මෙම සංක්‍රමණික කාලසීමාවල උච්ච අවස්ථාවල දී පැපිලොප්ටා හෙක්ටර් සහ පැපිලෙප්ටා ඇරිස්ටලෝකියා (පිළිවෙලින් ක්‍රිම්සන් රෝස් සහ කොමන් රෝස්) වැනි විශේෂයන් ස්වල්පයක් අප වෙරළට ද සංක්‍රමණය වනවා විය හැකි ය.

මෙනයින් බලන කල සමනලයින් වනාහී අප ජීවන පරිසරයේ ස්වාභාවික අංගයකි.

එබැවින්, පුරාණ කාලයේ පටන් ම ඔවුන් වටා රසවත් කතා සහ ජනප්‍රවාද අනිවාර්ය යෙන් ම ගෙතී ඇත. මෙම ජනප්‍රවාද අතුරෙන් ඉතාමත් ප්‍රචලිතව ඇත්තේ ලංකාවේ උසම කඳුවලින් එකක් වූ ශ්‍රී පාද කන්දේ සම්බුදු සිරි පා වැඳුමට සමනලයින් රංචුපිටින් යන බවය. සිරි පා කන්ද සමනල කන්ද නමින් ද හඳුන්වනු ලබන්නේ මෙනිසා ම නොවේ ද?



LIBRARY
Ministry of Environment &
Natural Resources.